සාපරාධී වරදක් සම්බන්ධයෙන් චෝදනා ලබන, කිසිදු බාලවයස්කරුවකු ගේ නම හෝ අනන්‍යතාවය හෙළි කරගත හැකි හැකි කරුණු දැන දැනම අනාවරණය නොකරන ලෙසින්, ජාත්‍යන්තර මාධ්‍ය මාගෙර්ෝපදේශයන් උපදෙස් දෙයි. ශ්‍රී ලංකාවේ මාධ්‍ය මාගෙර්ෝපදේශයන්හිද එලෙසින් ම සඳහන් වන අතර, වයස අවුරුදු 16 ලෙස බාලවයස්කරුවන් ගේ වයස දැක්වේ.
එසේම, සිය පාසල් සමය අනවශ්‍ය අතපෙවීම්වලින් තොරව සම්පූණර් කර ගැනීමට බාලයන්ට නිදහස තිබිය යුතු බව ද මාධ්‍ය හා දරුවන් සම්බන්ධ මාගෙර්ෝපදේශයන් එසේම දක්වයි.
ඒ අනුව, බාලවයස්කරුවන් සම්බන්ධයෙන් වන වාතර්ාකරණයන් ඉදිරිපත් කිරීමේදී, ඉහත කරුණු සම්බන්ධයෙන් මාධ්‍යවේදීන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු වේ.
කෙසේ නමුත්, පෞද්ගලික කාරණාවක් මත සිදු වූ බහින් බස් වීමක් හේතුවෙන්, ගැටුමක් ඇති කර ගත් 11වසරේ ඉගෙනුම ලබන සිසුන් දෙදෙනකු, තුවාල ලබා බදුල්ල රෝහලට ඇතුළත් කිරීමේ පුවතක්, දිනමිණ පුවත් ලිපියක් ඔස්සේ දැක් වී තිබුනේ මෙසේය.
සිරස්තල - "එක මලකට පෙම් කළ සිසුන් දෙදෙනා වාට්ටු දෙකක, මලේ අයිතියට ගුටි ඇනගෙන"
පුවත් අන්තගර්තය - මෙම සිසුන් දෙදෙනා 11 වසරේ බවත්, 16 හැවිරිදි බවත් දක්වයි. එසේම සිසුන් දෙදෙනාගේ නම්, ඉගෙන ගන්නා විද්‍යාල වල නම්, සහ පදිංචි ලිපිනයන්ද දක්වයි.
1) මෙම දාසය හැවිරිදි සිසුන් දෙදෙනාගේ, අනන්‍යතාවයන් සහ ඉගෙනුම ලබන පාසල් හෙළි වන සියලුම තොරතුරු දැක්වීම ඔස්සේ, ඔවුන්ගේ පාසල් අධ්‍යාපනයට බාධා නොපැමිණෙනු ඇතැයි දිනමිණට සහතික වීමට හැකිද?
2) මේ ආකාරයේ හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) සිරස්තල ඔස්සේ මෙම පුවත දැක්වීමෙන්, මෙම සිදුවීම දෙස නිරවද්‍යව සහ පක්ෂපාතීව බැලීමට පාඨකයාට ඉඩක් ලැබේ යැයි ඔබ සිතන්නේද?
මූලාශ්‍ර :
https://rm.coe.int/media-regulatory.../1680972898
https://www.editorscode.org.uk/the_code.php
https://www.unicef.org/eca/media/ethical-guidelines
https://slpi.lk/.../uploads/2021/09/Code-of-practice-Sin.pdf
https://accountablejournalism.org/.../empowering-children...
https://www.veriteresearch.org/.../%E0%B6%85%E0%B6%B4%E0.../
ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය (https://lms.cshr.cmb.ac.lk/.../child%20rights%20charter.pdf)